**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සති පාසල**

**1.ශ්‍රේණිය** -11 **විෂය** -පෙරදිග සංගීතය අදාළ සතිය-ජනවාරි 1වන සතිය

**2.ක්‍රියාකාරකම** - 1.1 බිලාවල් රාගය

**3.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -**

- 8 ශ්‍රේණියේ දී ඔබ උගත් බිලාවල් රාගයේ ස්වර ස්ථාපන ගීතය සහ 9 ශ්‍රේණියේ දී ඔබ උගත් බිලාවල් රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර , සර්ගම් ගීතය සහ මධ්‍යලය ගීතය මතකයට නඟන්න.
- බිලාවල් රාගයට අදාළ රාග විස්තරය , සර්ගම් ගීතය , මධ්‍යලය ගීතය හා ලක්ෂණ ගීතය ඔබගේ පොතෙහි පිළිවෙලින් පැහැදිලිව සටහන් කර ගන්න. ඒ සඳහා පහත සඳහන් දෘශ්‍යාධාරක භාවිත කරන්න.
- පහත සඳහන් ඉගෙනුම් ආධාරක එකින් එක අධ්‍යනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නිරතවන්න.

**බිලාවල් රාග විස්තරය**

| | | |
|---|---|---|
| මේලය/ථාටය | - | බිලාවල් |
| ආරෝහණය | - | සරි, ගමප, ධ, නිස් |
| අවරෝහණය | - | ස්, නිධප, මග, රිස |
| ජාතිය | - | සම්පූර්ණ සම්පූර්ණ |
| වාදී | - | ධ |
| සංවාදී | - | ග |
| අනුවාදී ස්වර | - | ස,රි,ම,ප,නි |
| ගාන සමය | - | දිවා ප්‍රථම ප්‍රහරය |
| මුඛ්‍යාංගය | - | ගරිගප, ධනිස් |

බිලාවල් රාගය සියලු ස්වර ශුද්ධ ව යෙදෙන රාගයකි. ස්වර හත ම භාවිත වේ.

**සර්ගම් ගීතය**

**රාගය - බිලාවල්** **තාලය - ත්‍රි තාල්**

ස්ථායි

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | | | | x | | | | 2 | | | | 0 | | | |
| ග | ප | ධ | නි | ස් | – | ධ | ප | ම | ග | ම | රි | ස | රි | ස | – |
| ග | – | ම | රි | ග | ප | ධ | නි | ස් | නි | ධ | ප | ම | ග | රි | ස |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | | | | x | | | | 2 | | | | 0 | | | |
| ප | ප | ධ | නි | ස් | – | ස් | ස් | ධ | නි | ස් | රි̇ | ස් | නි | ධ | ප |
| ග̇ | රි̇ | ස් | නි | ධ | ප | නි | ධ | ස් | නි | ධ | ප | ම | ග | රි | ස |

## මධ්‍යලය ගීතය

රාගය - බිලාවල් | තාලය - ත්‍රි තාල්

ස්ථායි

| 0 | | | | 3 | | | | x | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | රි | ග | ප | - | නි | ධ | නි | සං | - | ධ | ප | ම | ග | ම | රි |
| ම | න | නු | ච | න් | පි | න | න | මේ | s | අ | රු | ණෝ | s | දේs | ss |
| ග | ම | ප | ග | ම | රි | ස | ස | ධ | නි | සං | නි | ධ | ප | ම | ග |
| ළ | හි | රු | ය | ස් | ක | දි | න් | මි | හ |ත | ල | නැ | හැ | වේ | s |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | ප | ධ | - | නි | ධ | නි | සං | සං | සං | සං | සං | රිං | සං | - |
| තු | රු | ල | තා | s | මි | හි | රි | හැ | ගු | මෙ | න් | පි | බි | දී | s |
| සං | රිං | ගං | රිං | සං | නි | ධ | ප | ධ | නි | සං | නි | ධ | ප | ම | ග |
| ස | ල | තා | s | පි | ණි | මු | තු | ස | තු | ටි | න් | ඉ | පි | ලේ | s |

## මධ්‍යලය ගීතය

රාගය - බිලාවල් | තාලය - ත්‍රි තාල්

ස්ථායි

| x | | | | 2 | | | | 0 | | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධනි | සං | ධ | ප | ම | ග | ම | රි | ස | - | රි | ස | ග | - | ග | - |
| බඳු | වා | ජ | ය | ර | න් | ද | ද | ල | ං | කා | s | දේ | s | සේ | s |
| ග | ප | ධ | නි | සං | නි | ධ | ප | ම | ග | ම | රි | ස | රි | ස | - |
| නි | ජ | බි | ම | න | ං | ව | මු | සු | ර | තු | ර | වි | ල | සේ | s |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | - | නි | නි | සං | - | සං | - | සං | රිං | සං | නි | ධ | ප | ම | ග |
| දැ | s | හි | න | කා | s | මි | s | සි | රි | ල | ක් | ද | රු | ව | නි |
| ග | ප | ධ | නි | සං | නි | ධ | ප | ම | ග | ම | රි | ස | රි | ස | - |
| ම | ල් | ප | ල | ග | න් | ව | මු | කෙ | ත් | ව | තු | දෙ | ර | ණේ | s |

# ලක්ෂණ ගීතය

**රාගය - බිලාවල්** **තාලය - ත්‍රි තාල්**

ස්ථායි

| x | | | | 2 | | | | 0 | | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | ස | ග | ම | රි | ග | ප | – | ධ | ප | ම | ග | ග | ම | ප | – |
| ස | පි | රු | ණු | ර | ති | යේ | S | සු | ගැ | යෙ | න | උ | ද | යේ | S |
| ධ | නි | ස̇ | නි | ධ | ප | ම | ග | ග | රි | ග | ම | රි | රි | ස | – |
| ජ | න |ක | බි | ලා | S | ව | ල | සැ | ම | ස්ව | ර | සු | දු | වේ | S |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | ප | ධ | නි | ස̇ | – | ස̇ | ස̇ | ස̇ | රි̇ | ස̇ | නි | ධ | නි | ප | – |
| ග | ප | ධ | නි | ස̇ | S | ය | න | ස්ව | ර | ස | ං | ග | ති | වේ | S |
| ධ | නි | ස̇ | නි | ධ | ප | ම | ග | ග | රි | ග | ම | රි | රි | ස | – |
| ධා | S | ස්ව | ර | වා | S | දී | S | ග | S | ස | ං | වා | S | දී | S |

**4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කර ගත හැකි ඉගෙනුම් ආධාරක -**

සර්ගම් ගීතය ගායනය - https://youtu.be/TMB96ck7mUY

ලක්ෂණ ගීතය ගායනය - https://youtu.be/zwm9NFPnmcE

ලක්ෂණ ගීතය ගායනය - https://youtu.be/Ej6hFYFFaLU

මධ්‍යලය ගීතය ගායනය - https://youtu.be/vvbdYmGzUVQ

මධ්‍යලය ගීතය ගායනය - https://youtu.be/xacqpNRn350

මධ්‍යලය ගීතය ගිටාර් වාදනය - https://youtu.be/BkPFwjUz_5U

මධ්‍යලය ගීතය දිල්රුබා වාදනය - https://youtu.be/ka8SEQAU4HI

මධ්‍යලය ගීතය සිතාරය වාදනය - https://youtu.be/KVKaF1rAqMM

**ඇගයීම / තක්සේරුකරණය**

ඉහත කාර්යයන්හි  නිරත වූ ඔබ පහත ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

01. බිලාවල් රාගයේ ආරෝහණ - අවරෝහණ ස්වර , සර්ගම් ගීතය ශ්‍රැතියෙහි හා තාලයෙහි පිහිටමින් ගායනා කරන්න.

02.

I. බිලාවල් රාගයේ විශේෂ ස්වර සංගති 04 ක් සටහන් කරගන්න.

II. එම සංගති ශ්‍රැතිය පවත්වා ගනිමින් ගායනා කරන්න.

III. බිලාවල් රාගයේ  රාග විස්තරය වගුගත කරන්න.

03. ඉහත ප්‍රායෝගික ක්‍රියාකාරකම් හී දී පුහුණු වූ බිලාවල් රාගයේ තානාලංකාර 04 ක් නිවැරදි තාල සංකේත සහිතව , සටහන් පොතෙහි ප්‍රස්තාර කරන්න.

**5.ඉගෙනුම් ඵල** -

- ශිෂ්‍යයා, බිලාවල් රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර ශ්‍රැතියෙහි පිහිටමින් මතකයෙන් ගයයි.
- එම රාගයට අදාළ සර්ගම් ගීතය ශ්‍රැතිය හා තාලයෙහි පිහිටමින් ගායනා කරයි.
- බිලාවල් රාගයේ ලක්ෂණ ගීතය , රාග ලක්ෂණ පිළිබඳ අවබෝධයෙන් යුතුව ශ්‍රැතියෙහි හා තාලයෙහි පිහිටමින් ගායනා කරයි.
- බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය හා තානාලංකාර ශ්‍රැතිය හා තාලය පවත්වාගනිමින් ගායනා කරයි.
- සර්ගම් ගීතවල ඇති සුවිශේෂීතා ප්‍රකාශ කරයි.
- ලක්ෂණ ගීතය ඇසුරින් බිලාවල් රාගයේ රාග විස්තරය වගුගත කරයි.
- රාග ගායනය වාදනය කිරීමෙන් ලැබෙන මානසික සහනය හේතුවෙන් සතුටින් කාලය ගත කරයි.

සැකසුම - අයි. ආර්. දිලිනි චතුරිකා

තනතුර  - ශ්‍රී ලංකා ගුරු සේවය 2 - II